# කැලණිය විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

## වාණිජවිද්‍යාවේදී (විශේෂ) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) 2009

## 2010 ඔක්තෝබර්/නොවැම්බර්

### BCOM E 2045 – උසස් මූල්‍ය ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. 2009.12.31 දිනට අදාළ පහත දැක්වෙන ශේෂ පත්‍ර " ඒ " සමාගමෙන් හා " බී " සමාගමෙන් ලබා ගන්නා ලදී.

| | (රු '000) | |
|---|---|---|
| | ඒ සමාගම | බී සමාගම |
| දේපළ, පිරියත හා උපකරණ | 19,000 | 12,000 |
| (-) සමුච්චිත ක්ෂය | (3,000) | (4,000) |
| ලියා හල අගය | 16,000 | 8,000 |
| " බී " සමාගමෙහි ආයෝජන | 10,000 | - |
| ජංගම වත්කම් | 5,000 | 4,000 |
| | 31,000 | 12,000 |
| **හිමිකම හා වගකීම්** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 23,000 | 8,500 |
| රඳවාගත් ලාභ | 4,000 | 2,500 |
| වගකීම් | 4,000 | 1,000 |
| | 31,000 | 12,000 |

ඔබට පහත තොරතුරු සපයා ඇත.

(අ) " ඒ " සමාගම " බී " සමාගමේ 80% ක් 2008 දෙසැම්බර් 31 දින අත්පත් කරගත් අතර එදිනට රඳවාගත් ලාභ රු. 1,500,000 විය.

(ආ) 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ පිරිවැයට 25% ක ලාභයක් රඳවාගෙන " ඒ " සමාගම විසින් රු. 20,000 ක් වටිනා භාණ්ඩ " බී " සමාගමට විකුණන ලදී. මෙම වටිනාකම " ඒ " සහ " බී " සමාගම් වල ණයගැති හා ණයහිමි ගිණුම් වල ඇතුළත් වේ.

(ඇ) ශේෂ පත්‍ර දිනට ඉහත අයිතම් වලින් 50% ක් විකුණා නොතිබුණි. මෙම තොගය " බී " සමාගමේ 2009.12.31 දින අවසාන තොගය තුළ ඇතුළත් වේ.

ඔබ විසින් 2009.12.31 දිනට ඒකාබද්ධ ශේෂ පත්‍රය පිළියෙල කළ යුතුවේ.

(ලකුණු 30)

ප්‍රකාශනයන්ගෙන් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

| | (රු '000) | |
|---|---|---|
| | ඇල්ෆා | බීටා |
| විකුණුම් | 6,244 | 2,792 |
| විකුණුම් පිරිවැය | (4,683) | (1,860) |
| දළ ලාභය | 1,561 | 932 |
| බෙදාහැරීමේ වියදම් | (238) | (228) |
| පරිපාලන වියදම් | (862) | (484) |
| බදු පෙර ලාභය | 461 | 220 |
| බදු | (126) | (45) |
| බදු පසු ලාභය | 335 | 175 |
| අතුරු ලාභාංශ | (50) | - |
| රඳවාගත් ලාභ | 285 | 175 |
| ඉදිරියට ගෙන ශේෂය | 521 | (20) |
| සමුච්චිත ලාභය | 806 | 155 |

අතිරේක තොරතුරු පහත පරිදි වේ.

(අ) 2008.12.31 දින ඇල්ෆා සමාගම බීටා සමාගමේ 80% ක් අත්පත් කරගන්නා ලදී.

(ආ) 2009.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළ පිරිවැයට 20% ක් එකතු කළ මිලට බීටා සමාගම ඇල්ෆා සමාගමට රු. 600,000 ක භාණ්ඩ විකුණන ලදී. මෙම භාණ්ඩ වලින් 1/5 ක කොටසක් 2009.12.31 දිනට ඇල්ෆා සමාගමෙහි ඉතිරි වී තිබුණි.

2009.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය ඔබ විසින් පිළියෙල කළ යුතු වේ.

(ලකුණු 30)

03. ගැප් සමාගමේ ශේෂ පත්‍ර හා ලාභ අලාභ ගිණුම පහත පරිදි වේ.

ගැප් සමාගම ශේෂ පත්‍ර

| | 2010.03.31 දිනට (රු '000) | 2009.03.31 දිනට (රු '000) |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 628 | 514 |
| ජංගම වත්කම් | | |
| තොග | 114 | 120 |
| වෙළඳ ණය ගැතියෝ | 168 | 145 |
| මුදල් | 107 | 92 |
| මුළු වත්කම් | 1,017 | 871 |
| හිමිකම් හා වගකීම් | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු. 10 බැගින්) | 320 | 260 |
| ප්‍රත්‍යාගණන සංචිත | 110 | 100 |
| සමුච්චිත ලාභ | 314 | 282 |
| | 744 | 642 |

| | | |
|---|---|---|
| ජංගම නොවන වගකීම් | | |
| 10 % ණයකර | 80 | 50 |
| ජංගම වගකීම් | | |
| වෙළඳ ණයහිමියෝ | 136 | 121 |
| ගෙවියයුතු බදු | 39 | 28 |
| උපචිත වියදම් | 18 | 16 |
| බැංකු අයිරාව | - | 14 |
| මුළු හිමිකම හා වගකීම් | 1,017 | 871 |

ගැප් සමාගම

2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ලාභ අලාභ ගිණුම

| | (රු '000) |
|---|---|
| ආදායම | 600 |
| විකුණුම් පිරිවැය | (318) |
| දළ ලාභය | 282 |
| අනෙකුත් වියදම් (රු. 42,000 ක ක්ෂය ඇතුලත්ව) | (195) |
| බදු පෙර ලාභය | 87 |
| බදු | (31) |
| බදු පසු ලාභය | 56 |
| ලාභාංශ | (24) |
| වර්ෂය තුළ රඳවාගත් ලාභ | 32 |

අතිරේක තොරතුරු,

වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ කිසිවක් විකුණා නොමැත.

2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඔබ විසින් පිළියෙල කළ යුතු වේ.

(ලකුණු 25)

04. සාමාන්‍ය කොටස් 50,000 ක් එකක් රු. 20 බැගින් නිකුත් කිරීමට සමාගමක් තීරණය කරන ලදී. මුදල් පහත පරිදි ගෙවිය යුතු විය.

| | |
|---|---|
| අයදුමේදී | රු. 10/- |
| විභජනයේදී | රු. 05/- |
| ඇරයුමේදී | රු. 05/- |

කොටස් 80,000 ක් සඳහා අයදුම්පත් ලැබුණු අතර එයින් 10,000ක් ප්‍රතික්ෂේප කිරීමට සමාගම තීරණය කරන ලදී. ඉතිරිය සමානුපාතිකව විභජනය කරන ලදී.

කොටස් 7,000 ක් අයදුම් කළ කොටස් හිමියෙකු ඇරයුම් මුදල් ගෙවීමට අපොහසත් විය. ඉතිරි ඇරයුම් මුදල් හා විභජන මුදල් නිසි පරිදි ලැබිණි.

ඉහත ගනුදෙනු වාර්තා කිරීම සඳහා අවශ්‍ය ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.

(ලකුණු 10)

05. 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව පහත දෑ නිර්වචනය කරන්න.

(අ) ණය ගෙවීමේ හැකියාව /නුබුන්වත් බව පිළිබඳ පරීක්ෂණය

(ආ) ප්‍රකාශිත ප්‍රාග්ධනය

(ලකුණු 05)